# 4 අක්ෂරමාලාව හා පිල්ලම්

අප කතා කිරීමේ දී විවිධ ශබ්ද මුවින් නිකුත් වෙයි. ඒ ශබ්ද ලියා දැක්වීම සඳහා විවිධ සංකේත භාවිත කෙරෙයි. එම සංකේත අක්ෂර නමින් හැඳින්වේ. එක් භාෂාවකට අයත් අක්ෂර සියල්ල එකතු වූ විට එය හෝඩිය හෙවත් අක්ෂරමාලාව යනුවෙන් නම් කළ හැකි ය. නූතන සිංහල අක්ෂරමාලාව සහ පිල්ලම් පිළිබඳව මෙම පාඩම සකස් වී ඇත.

## සිංහල අක්ෂරමාලාව

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

අක්ෂරමාලාව කොටස් දෙකකට බෙදේ.

1. ස්වර
2. ව්‍යඤ්ජන

## ස්වර

සිංහල අක්ෂරමාලාවේ ඇති ස්වර පහත දැක්වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |

ස්වරයක් ඊට නියමිත රූපයෙන් ම ලියන්නේ වචනයක මුල් ශබ්දය හැටියට යෙදෙන අවස්ථාවල දී පමණි. ස්වර ශබ්ද වචනයක මැද හෝ අග යෙදෙන විට ඒවා ව්‍යඤ්ජන ශබ්දයක් හා එකතු කොට ලියනු ලැබේ. එවිට ස්වරයට නියමිත රූපය වෙනුවට ව්‍යඤ්ජනයට විශේෂ සංකේත කිහිපයක් එක් කර ගැනේ. ඒ සංකේත, පිලි යනුවෙන් හැඳින්වේ.

### ස්වර, වචනයක මුල යෙදීම

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | - | අම්මා | ආ | - | ආතා |
| ඇ | - | ඇඹුල් | ඈ | - | ඈත |
| ඉ | - | ඉවුර | ඊ | - | ඊතලය |
| උ | - | උකුස්සා | ඌ | - | ඌරා |
| ඍ | - | ඍජුකෝණය | එ | - | එන්න |
| ඒ | - | ඒදණ්ඩ | ඓ | - | ඓතිහාසික |
| ඔ | - | ඔංචිල්ලාව | ඕ | - | ඕලු |
| ඖ | - | ඖෂධ | | | |

### ස්වර, වචනයක මැද හෝ අග යෙදීම

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ර් | - | උ | → | රු | ඔරුව | ඔ+ර්+උ+ව්+අ |
| ද් | - | ඇ | → | දැ | උදැල්ල | උ+ද්+ඇ+ල්+ල්+අ |
| ග් | - | ඉ | → | ගි | ගිනි | ග්+ඉ+න්+ඉ |

## ව්‍යඤ්ජන

පහත දැක්වෙනුයේ සිංහල අක්ෂර මාලාවේ ඇති ව්‍යඤ්ජන යි.

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

ස්වරයක් තනි ව උච්චාරණය කළ හැකි නමුත් ව්‍යඤ්ජනයක් තනි ව උච්චාරණය කිරීම අපහසු ය.

ක් ග් ච් ජ්

මේ අක්ෂර ස්වරයක් සමග යෙදෙන විට උච්චාරණය කිරීම පහසු වේ.

ක් + අ → ක
ග් + අ → ග
ච් + අ → ච
ජ් + අ → ජ

සෑම ව්‍යඤ්ජනයක් ම හල් කළ නොහැකි ය. එසේ හල් කළ නොහැකි ව්‍යඤ්ජන පහත දැක්වෙයි:

(අ)ං (අ)ඃ
ඟ ඦ ඬ ඳ ඹ
ළ

ඉහත සඳහන් කර ඇති පරිදි ස්වර අක්ෂර, ව්‍යඤ්ජන අක්ෂර සමග එකතු වීමේ දී එය සංකේතවත් කෙරෙන පිල්ලම් රාශියක් සිංහල භාෂාවේ දක්නට ලැබේ. ඒ පිල්ලම් මෙසේ හඳුනා ගනිමු.

| **ස්වරය** | **යෙදෙන පිල්ලම** | **පිල්ලමෙහි නාමය** | **පිල්ලම් අකුරුවල යෙදෙන ආකාරය** |
|---|---|---|---|
| අ | පිල්ලමක් නැත | - | කවියා, රසිකයා, ගඟ |
| ආ | ා | ඇලපිල්ල | කාසිය, රබාන, මනාලිය |
| ඇ | ැ | කෙටි ඇදපිල්ල | කැකිරි, වැහැරෙනවා, ඇහැ |
| ඈ | ෑ | දිගු ඇදපිල්ල | කෑම, හැන්දෑව, රෑන |
| ඉ | ි | ඉස්පිල්ල | කිතුල්, මාපිය, පිහිටි |
| ඊ | ී | දිගු ඉස්පිල්ල | කීර්තිය, අදීන, ශරීර |
| උ | ු ු ැ | කෙටි පාපිල්ල | කුරහන්, උදුම්බරා, වගුරු |
| ඌ | ූ ූ ෑ | දිගු පාපිල්ල | කූඹියා, අනූව, රූපය |
| එ | ෙ | කොම්බුව | කෙක්ක, සැලෙනවා, මෙහෙ |
| ඒ | ේ | කොම්බුව සහ හල් ලකුණ | කේක්, මේසය, මහේෂිකාව |
| ඓ | ෛ | කොම්බු දෙක | වෛද්‍ය, වෛරය, ධෛර්යය |
| ඔ | ො | කොම්බුව සහ ඇලපිල්ල | කොස්, මොහොත, පොල් |
| ඕ | ෝ | කොම්බුව සහ හල් ලකුණ සහිත ඇලපිල්ල | කෝරලය, විනෝදය, යහළුවෝ |
| ඖ | ෞ | කොම්බුව සහ ගයනුකිත්ත | කෞතුකාගාරය, මහෞෂධ, භෞතික |
| ඍ | ෘ | ගැටපිල්ල | කෘමියා, අමෘතය, කර්තෘ |
| ඎ | ෲ | ගැටපිලි දෙක | කර්තෲන්, ශාස්තෲන්, වක්තෲන් |

## අවබෝධය

1. ස්වරයක් හෝඩියේ දැක්වෙන රූපයෙන් ම ලියන්නේ වචනයක කුමන ස්ථානයේ යෙදෙන විට ද?
2. හල් කළ නොහැකි ව්‍යඤ්ජන අක්ෂර දෙකක් ලියන්න.
3. පිල්ලමක් භාවිත නොකරන්නේ කුමන ස්වර අක්ෂරයක් සංකේතවත් කිරීමට ද?
4. එක ම ස්වරයක් සංකේතවත් කිරීමට විවිධ අකුරුවලට විවිධ පිල්ලම් භාවිත කෙරෙන ස්වර, පාඩමේ වගුවෙන් උපුටා ලියන්න.
5. පිල්ලම් දෙකකට වඩා භාවිත කරමින් සංකේතවත් කරන්නේ කිනම් ස්වරය ද?

## ලිඛිත අභ්‍යාස

1. පෙළ පොතේ ඇති පාඩම්වලින් ස්වර මුලට යෙදෙන වචන හා ව්‍යඤ්ජන මුලට යෙදෙන වචන දහය බැගින් වගුවක සටහන් කරන්න.
2. පහත සඳහන් අක්ෂර යෙදෙන වචන දෙක බැගින් ලියන්න.
   i. ඉ
   ii. උ
   iii. ඎ
   iv. ඓ
   v. ඖ

## ප්‍රායෝගික අභ්‍යාස

1. දිනපතා පළ වන පුවත්පතක් හෝ ළමා නවකතාවක් හෝ තෝරා ගෙන එහි ඇති, පිල්ලම් යෙදෙන වචන අනුපිළිවෙළින් ලියා පොත් පිංචක් සකස් කරන්න. ඔබ තෝරා ගත් පිල්ලම සහිත අක්ෂරය පාඨ කරන්න.
2. සිංහල අක්ෂරමාලාව පන්තිය ඉදිරියේ මතකයෙන් කියවන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.